# ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය

## <u>ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ වැඩිහිටි නායකයින් පුහුණු කිරීමේ කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති මාලාව</u>

(1.) ශ්‍රී ලංකාවේ වැඩිහිටි නායකයින් පුහුණු කිරීමේ කටයුතු අංශ තුනකට බෙදා ඇත.

i. ඒකක නායක පුහුණුව

ii. ඒකක නායක පුහුණුකරුවන්ගේ පුහුණුව

iii. සමූහ බාලදක්ෂ නායකයින්, කොමසාරිස්වරුන් හා ගිහි නායකයින් ඇතුළු පරිපාලකයින්ගේ පුහුණුව

(2.) ජාතික පුහුණු කිරීමේ මණ්ඩලය ක්‍රියාකාරී, වලංගු, සහතිකයක් ලද, පුහුණු කිරීමේ නායකයින් හා සහය පුහුණු කිරීමේ නායකයින්ගෙන් සමන්විත ය.

(3.) ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ වැඩිහිටි නායකයින් පුහුණු කිරීමේ සියළු කටයුතු පිළිබඳව ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්තුමා ප්‍රධාන කොමසාරිස්තුමාට වගකිව යුතු ය. මේ කටයුතු සම්බන්ධයෙන් ජාතික පුහුණු කිරීමේ මණ්ඩලය ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්තුමාට වගකිව යුතු ය.

(4.) පුහුණු කිරීමේ නායකයින් හා සහය පුහුණු කිරීමේ නායකයින් පත්කරනු ලබන්නේ ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්තුමාගේ නිර්දේශය මත ප්‍රධාන කොමසාරිස් තුමා විසිනි. මේ සේවය සඳහා ලබාදෙන සේවා භාර කිරීමේ ලිපිය වසරක කාලයක් සඳහා වලංගුවේ. සෑම වසරක් අවසානයේදී ම මෙම සේවා භාර කිරීමේ ලිපිය නවීකරණය කළ යුතු ය. පුහුණු කිරීමේ නායකයා, සහය පුහුණු කිරීමේ නායකයා තම පත්වීම ඉදිරි <u>**දෙවසර**</u> සඳහා නවීකරණය කර නොගතහොත් මෙම පත්වීම අවලංගුවේ.

(5.) ජාතික පුහුණුකිරීමේ කොමසාරිස්තුමාගේ නිර්දේශය මත ඕනෑම අවස්ථාවක මේ පත්වීම ප්‍රධාන කොමසාරිස්තුමාට අවලංගු කළ හැකිය.

(6.) **ඒකක නායක පුහුණුව**

i. වැඩිහිටි නායක පුහුණුව අංශ තුනක් යටතේ පැවැත්වේ. පෝතක බාලදක්ෂ, බාලදක්ෂ හා මානවක බාලදක්ෂ වශයෙනි.

ii. ඒකක නායක පුහුණුව ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ අදියර පහකින් යුත්, ඒකක නායක පුහුණු නිර්දේශ අනුව කරගෙන යනු ලැබේ.

iii. වගුව - 2

| අදියර | බලපත්‍රය | වලංගු කාලය | නිල ඇඳුම |
|---|---|---|---|
| I අදියර | සම්මන්ත්‍රණයේ දී සාමාජිකත්වයට ඇතුලත් වීමෙන් පසු බලපත්‍ර ලිපිය (Letter of Authority) ඉල්ලුම් කර ලබාගත යුතු ය. | වසර 2 කි. (නවීකරණය කළ නොහැක.) | අදාල අංශයේ නායක නායිකාවන් සඳහා නියමිත නිල ඇඳුම ඇඳිය යුතු ය. තමා අයත් රැළේ/ කණ්ඩායමේ සමූහ කරලේන්සුව පැළඳිය හැකි වේ. |
| II අදියර | පාඨමාලාව සාර්ථකව නිමකළ පසු අධිකාරි පත්‍රය (Warrant) ඉල්ලුම් කර ලබාගත යුතු ය. | වසර 1 කි. ඊළඟ වසර සඳහා නවීකරණය කරගත යුතු ය. | නියමිත නිල ඇඳුම හා කරලේන්සුව පැළඳීමේ දී ගිල්වෙල් වොගලය පැළඳිය හැකිවේ. |
| IV අදියර | අධිකාරි පත්‍රය (Warrant) | තමා සතු අධිකාරි පත්‍රය වාර්ෂිකව නවීකරණය කළ යුතු ය. | නියමිත නිල ඇඳුම, හා ගිල්වෙල් වොගලය පැළඳිය හැකිවේ. |
| V අදියර | අධිකාරි පත්‍රය (Warrant) | එම | නියමිත නිල ඇඳුමට **ගිල්වෙල් කරලේන්සුව හා** දාර පබළු දෙක සහිත පළඳනාව පැළඳිය හැකි වේ. |

iv. I,II හා IV අදියර පුහුණුවේ ප්‍රතිඵල ලේඛනය ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්තුමා අනුමත කළ දින සිට වලංගු වේ.

v. එකම කාලසීමාවක් තුල එකම අංශයක් වෙනුවෙන් එක් පාඨමාලාවකට වඩා නොපැවැත්විය යුතු ය.

vi. ලී පදක්කම් පාඨමාලාවකට සහභාගී වි හැක්කේ වයස අවුරුදු 20 සම්පූර්ණ වීමෙන් පසුවය.

vii. ලී පදක්කම ප්‍රදානය කළ යුත්තේ වයස අවුරුදු 22 සම්පූර්ණ වූ පසුව ය.

viii. **IV අදියර පුහුණුවෙන් පසු, ප්‍රතිඵල නිකුත් වූ දින සිට ම, V අදියර ව්‍යාපෘති කටයුතු ආරම්භ කළ හැකි ය.**

ix. **IV අදියර පුහුණුවෙන් පසු, වසර දෙකක් ඇතුලත ව්‍යාපෘති කටයුතු නිම කළ යුතු ය. විශේෂ හේතු මත පමණක්, කාලය දීර්ඝ කිරීමට ජාතික පුහුණු කිරීමේ කොමසාරිස් තුමාගේ අනුමැතිය ලබා ගත යුතු ය.**

x. ලී පදක්කම ප්‍රදානය ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්තුමා විසින් පවත්වන සම්මුඛ පරීක්ෂණයකින් පසුව නිර්දේශ කෙරේ.

xi. ලී පදක්කම් ප්‍රදානය ද, ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්තුමා අනුමත කළ දින සිට වලංගු වේ.

xii. එක් අංශයක ලී පදක්කමක් දිනාගත් අයකු තවත් අංශයක පුහුණුව ලැබීමට, I අදියර හැදෑරීමට අදහස් කරන්නේ නම් තම ලී පදක්කම දිනාගත් අංශයේ අවම වශයෙන් වසර දෙකක් හෝ සේවය කර තිබිය යුතු ය. තමා බලාපොරොත්තු වන අංශයේ I අදියරෙන් පසු ඊට අදාල බලපත්‍ර ලිපිය ලබාගත යුතු ය.

(7.) **ඒකක නායක පුහුණුකරුවන්ගේ පුහුණුව**

(අ.) ඒකක නායක පුහුණුකරුවන්ගේ පුහුණු කිරීම පහත සඳහන් පරිදි අදියර දෙකකින් යුක්තවේ.

i. සහය පුහුණු කිරීමේ නායක පාඨමාලාවක් මගින් සහය පුහුණු කිරීමේ නායකයින් පුහුණු කිරීම

ii. පුහුණු කිරීමේ නායක පාඨමාලාවක් මගින් පුහුණු කිරීමේ නායකයින් පුහුණු කිරීම

(ආ.) පුහුණු කිරීමේ නායක/ සහය පුහුණු කිරීමේ නායක පාඨමාලාවක් හැදෑරීමට අපේක්ෂා කරන සියළු අයදුම්කරුවන් ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්තුමා ඇතුළු එතුමා විසින් පත්කරනු ලබන තිදෙනෙකුට නොඅඩු පුහුණු කිරීමේ නායකයින්ගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ පෙනීසිට සමත්විය යුතු ය.

(8.) **සහය පුහුණු කිරීමේ නායක පාඨමාලාවක් හැදෑරීම සඳහා තිබිය යුතු සුදුසුකම්**

(අ.) වැඩිහිටියන් පුහුණු කිරීම පිළිබඳවත් බාලදක්ෂ පරමාර්ථයන් ප්‍රතිපත්ති හා බාලදක්ෂ ක්‍රම පිළිබඳවත්, ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ අරමුණු පිළිබඳවත් දැඩි අවබෝධයක් හා පිළිගැනීමක් තිබිය යුතු ය.

(ආ.) සහය පුහුණු කිරීමේ නායක පාඨමාලාවක් හදාරන අය පෝතක බාලදක්ෂ/ බාලදක්ෂ/ මානවක බාලදක්ෂ යන අංශයන්ගෙන් එක් අංශයකවත් ලී පදක්කම පිළිබඳ ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ ඉදිරිපත් කර ඇති සියළු අවශ්‍යතා සම්පූර්ණ කර ලී පදක්කම සමත්ව සිටිය යුතු ය.

**(ඇ.)**

i. **අවම වශයෙන් අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් සමත්වීම හා ලී පදක්කම්ධාරියෙක් වශයෙන් අවුරුදු 05 ක අවම සේවා කාලයක් තිබීම හෝ**

ii. **පුහුණු ගුරුවරයෙකු වීම හා අවුරුදු 05 ක ලී පදක්කම්ධාරියකු ලෙස සේවා කාලය තිබීම හෝ**

iii. **අ.පො.ස. (සා/පෙ) සමත් නම්, ලී පදක්කම සමත් ව අවුරුදු 10 ක සේවා කාලයක් තිබීම.**

**(ඈ.) ආසන්න වසර 02ක් තුළ අදාල අංශයේ ක්‍රියාකාරි නායකයකු/නායිකාවක සිටින බවට ලිඛිත ව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතු ය.**

i. **ආසන්න වසර දෙකක් සඳහා නවීකරණය කළ බලපත්‍රය**

ii. **අදාල කණ්ඩායම හෝ රැළ පවත්වාගෙන බවට විදුහල්පති හෝ ආයතන ප්‍රධානියාගේ ලිඛිත නිර්දේශය**

(ඉ.) සහය පුහුණු කිරීමේ නායක පාඨමාලාවකට සහභාගී විය හැක්කේ වයස අවුරුදු 30 සම්පූර්ණ වීමෙන් පසුවය.

(9.) සහය පුහුණු කිරීමේ නායක පාඨමාලාව සමත් වීමෙන් පසු සහය පුහුණු කිරීමේ නායකයෙකු ලෙස පත්වීමට නම් අදාල අංශයෙන් පහත කරුණු සම්පූර්ණ කළ යුතු ය.

1. දිස්ත්‍රික් හෝ ජාතික මට්ටමේ අවම ලෙස වසරක ක්‍රියාකාරී සේවයක් ඉටුකර තිබීම.
2. පළමු අදියර පාඨමාලාවක් සංවිධානය කිරීම
3. පළමු අදියර පාඨමාලාවක ආචාර්ය මණ්ඩලයේ පූර්ණකාලීනව සේවය කිරීම
4. දෙවන අදියර පාඨමාලාවක ආචාර්ය මණ්ඩලයේ පූර්ණකාලීනව සේවය කිරීම
5. **<u>තුන්වන අදියර ගුරු උපදේශකවරයකු ලෙස පුහුණුවන්නාගේ III අදියර වාර්තා පොත, අදාල කාල සීමාව තුළ සම්පූර්ණ කරවීම.</u>**
6. හතරවන අදියර පාඨමාලාවක ගුරු උපදේශකවරයකු ලෙස සේවය කිරීම.
7. **<u>ඉහත 1 සිට 6 දක්වා වන වාර්තා, ගුරු උපදේශකගේ නිර්දේශය සහිත ව ජාතික පුහුණු කිරීමේ කොමසාරිස් තුමා වෙත ඉදිරිපත් කළ යුතු ය.</u>**
8. අදාල කාලය තුල සහභාගීවන්නාගේ අධිකාරී පත්‍රය ද නවීකරණය වී තිබිය යුතු ය.
9. සහාය පුහුණු කිරීමේ නායක ප්‍රදානය ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්තුමා විසින් පවත්වන සම්මුඛ පරීක්ෂණයකින් පසුව නිර්දේශ කෙරේ.
10. සහාය පුහුණු කිරීමේ නායක පත්වීම ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්තුමා අනුමත කළ දින සිට වලංගු වේ.

(10.) **පුහුණු කිරීමේ නායක පාඨමාලාවක් හැදෑරීම සඳහා තිබිය යුතු සුදුසුකම්**

(අ.) වැඩිහිටි නායකයින් පුහුණු කිරීම පිළිබඳවත් බාලදක්ෂ පරමාර්ථයන් ප්‍රතිපත්ති හා බාලදක්ෂ ක්‍රම පිළිබඳවත් ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ අරමුණු පිළිබඳවත් දැඩි අවබෝධයක් හා පිළිගැනීමක් තිබිය යුතු ය.

(ආ.) සහය පුහුණු කිරීමේ නායකයෙකු වශයෙන් අවුරුදු තුනක් සතුටුදායක සේවයක් කර තිබිය යුතු ය. මෙම සේවය අවම වශයෙන් IV අදියර උසස් පාඨමාලාව සහ II වන අදියර පාඨමාලාවක ආචාර්ය මණ්ඩලයේ පූර්ණකාලීනව සේවය කර තිබීම හා I වන අදියර පාඨමාලාවක පාඨමාලා නායකුව සිටීම ඇතුලත් විය යුතු ය.

(ඇ.) පුහුණු කිරීමේ නායක පාඨමාලාවකට සහභාගී විය හැක්කේ වයස අවුරුදු 35 සම්පූර්ණ වීමෙන් පසුවය.

(11.) **පුහුණු කිරීමේ නායක පත්වීම ලැබීමට නම්, පුහුණු කිරීමේ නායක පාඨමාලාවක් සමත්වීමෙන් පසු අදාල අංශයෙන්, පහත සඳහන් කරුණු සම්පූර්ණ කළ යුතු ය.**

1. දිස්ත්‍රික්ක මට්ටමෙන් හෝ ජාතික මට්ටමෙන් අවම වශයෙන් අවුරුද්දකවත් සතුටුදායක සේවයක් ඉටුකර තිබීම.
2. මෙම සේවයට II අදියර පාඨමාලාවක පාඨමාලා නායකු ව/ නායිකාවක ලෙස සේවය කර තිබිය යුතු ය.

3. III වන අදියර ගුරු උපදේශක සේවය සම්පූර්ණ කර තිබිය යුතු ය.

4. මෙම එක් අවුරුදු කාලය තුල IV වන අදියර පාඨමාලාවක පූර්ණකාලීන සේවය කර තිබිය යුතු ය.

5. V වන අදියර ගුරු උපදේශකවරයකු ලෙස සේවය කර තිබිය යුතු ය.

6. ජාතික හෝ දිස්ත්‍රික් මට්ටමින් මහජන සම්බන්ධතා ගොඩනගන ක්‍රියාකාරකමක් හෝ වැඩි ගණනක් ක්‍රියාත්මක කර තිබිය යුතු ය.

7. **ඉහත 1 සිට 6 දක්වා වන වාර්තා, ගුරු උපදේශකගේ නිර්දේශය සහිත ව ජාතික පුහුණු කිරීමේ කොමසාරිස් තුමා වෙත ඉදිරිපත් කළ යුතු ය.**

8. අදාල කාලය තුල සහභාගීවන්නාගේ අධිකාරී පත්‍රයද නවීකරණය වී තිබිය යුතු ය.

9. පුහුණු කිරීමේ නායක ප්‍රදානය ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්තුමා විසින් පවත්වන සම්මුඛ පරීක්ෂණයකින් පසුව නිර්දේශ කෙරේ.

10. පුහුණු කිරීමේ නායක පත්වීම ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්තුමා අනුමත කළ දින සිට වලංගු වේ.

(12.) **පරිපාලකයින්ගේ පුහුණුව**

පරිපාලකයින්ගේ පුහුණු කිරීම් පහත දැක්වෙන පරිදි අංශ හතරක් යටතේ කෙරෙනු ඇත.

1. සමූහ බාලදක්ෂ නායකයින්ගේ පුහුණුව
2. කොමසාරිස්වරුන්ගේ පුහුණුව
3. ගිහි නායකයින්ගේ පුහුණුව
4. වෘත්තිකයින්ගේ පුහුණුව

(13.) (අ.) සියළුම **වැඩිහිටි නායක පුහුණු කිරීමේ පාඨමාලා** පැවැත්විය යුත්තේ, ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්තුමාගේ ලිඛිත අනුමැතිය, නියමිත කාලසීමාව තුලදී ලබාගැනීමෙන් පසුවය.

(ආ.) සෑම දිසාවකම දිස්ත්‍රික් පුහුණු කිරීමේ **කණ්ඩායමක්** තිබිය යුතු අතර, එය සහය දිසා කොමසාරිස් (පුහුණු) හා දිසා කොමසාරිස්තුමාගේ අනුමැතිය ඇතිව ක්‍රියාත්මක කළ යුතු ය.

(14.) සෑම පාඨමාලාවක්ම ඊට අදාල ව පුහුණු කිරීමේ දෙපාර්න්තමේන්තුව විසින් සකස්කර ඇති නීති මාලාවට හා සැලැස්මට අනුකූලව ක්‍රියාත්මක විය යුතු ය.

(15.) පුහුණු කිරීමේ කටයුතු විධිමත් ව පවත්වාගෙන යාම සඳහා **"පුහුණු කිරීමේ අත්පොත " (Training Manual)** අනුව කටයුතු කළ යුතු ය.

**එම් ඊ එස් ජයසිංහ**
**ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්**
**පුහුණු කිරීමේ අංශය**
**ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය**

**2013.10.09**